රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 186

මගේ අංකය: 2/9/750 (ඩී)
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1981 ජනවාරි මස 13 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

## විනය පරීක්ෂණ කඩිනමින් ඇවර කිරීම.

"රාජ්‍ය නිලධාරීන්ගේ දිග්ගැස්සුණු වැඩ තහනම් කිරීම්" යන මැයෙන් වූ 1973 නොවැම්බර් 09 දිනැති අංක 77 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට සහ "විනය පරීක්ෂණ කඩිනමින් ඇවර කිරීම" යන මැයෙන් වූ අංක 195, 211 සහ 256 දරන, පිළිවෙලින් 1976.01.08, 1976.07.06 සහ 1978.01.19 දිනැති ආයතන චක්‍රලේඛ ලිපිවලට අවධානය යොමු කළ මැනවි.

02. එවැනි උපදෙස් දී තිබියදීත් බොහෝ අවස්ථාවල අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු, චෝදනා සකස් කිරීම මෙන්ම විනය පරීක්ෂණ ආරම්භ කිරීම සහ හමාර කිරීම පමා කර ඇත. මෙය අදාල නිලධරයාට අසාධාරණයක් වන අතරම, සේවයක යෙදවීමෙන් තොරව නිලධරයන් වැඩතහනම් කර තැබීම නිසා රජයට අනවශ්‍ය වියදම් දැරීමට ද සිදුවේ. සමහර අවස්ථාවලදී ප්‍රමාදයට හේතුව පැමිණිලිලට අදාල කරුණු උසාවියක නඩු විභාගයකට යොමු වී තිබීමය.

03. එම නිසා අදාල ලේඛන ලබා ගැනීමට නොහැකි අවස්ථා වැනි වැදගත් හේතූන් නිසා විනය බලධරයා විනය පරීක්ෂණ ප්‍රමාද කිරීමට තීරණය කරන්නේ නම් මිස, වැඩ තහනම් කර සිටින හෝ එසේ නොවන නිලධරයකුට විරුද්ධව කරුණු අධිකරණයේ විනිශ්චයකට යොමුවී තිබියදී වුවද, විනය බලධරයා විනය පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කළ යුතුයයි රජය තීරණය කර ඇත. චෝදනා සම්බන්ධව පොලිසියට හෝ අල්ලස් කොමසාරිස්ට කරුණු යොමුකර ඇති විට, විනය බලධරයා අවශ්‍ය ලේඛනවල ඡායා පිටපත් ලබා ගෙන විනය පරීක්ෂණ කටයුතු අවසන් කළ යුතු ය.

04. ආයතන සංග්‍රහයේ (II කාණ්ඩය) XLVIII වන පරිච්ඡේදයේ 21:1 වන වගන්තිය අනුව, පහත සඳහන් අවස්ථාවලදී නම්,

ඔප්පු වුනොත් සේවයෙන් පහකිරීමට තරම් බරපතල වූ චෝදනා පිට නිලධාරියකුට විරුද්ධව විනයානුකූල කටයුතු කිරීමට නැතහොත් අපරාධ නඩුවක් පැවරීමට ආරම්භ කොට හෝ ආරම්භ කිරීමට සූදානම්ව සිටින විට, හෝ

19:2 වැනි වගන්තියේ ප්‍රකාර නිසි විනය බලධාරියා විසින් සලකා බලනු ලැබීමෙන් පසුව නිලධාරියකු සේවයෙන් පහ කිරීමට තරම් හේතු ගුණ වන බරපතල වූ කාරණයක් සම්බන්ධයෙන් උසාවියකින් හෝ ව්‍යවස්ථාපිත බලධාරියකුගෙන් 19:1 වැනි වගන්තියේ ප්‍රකාර වාර්තාවක් ලැබී ඇති විට නැතහොත් 18:1 වැනි වගන්තියේ ප්‍රකාර වරදක් කර තිබෙන බව එළිදරව් වී ඇති විට

/2 පිටුවට...

නිලධාරියාට ඔහුගේ නිලයට අයත් රාජකාරි කටයුතු කරගෙන යාමට ඉඩදීම සුදුසු නොවේ යයි හැඟී යන්නේ නම් පමණක් වහාම එම නිලධරයාගේ වැඩ තහනම් කළයුතු බව සැලකිය යුතු ය.

05.

(අ) වැඩ තහනම් කර සිටින නිලධරයාට විරුද්ධව වැඩ තහනම් කළ දින සිට මාසයක් ඇතුළත චෝදනා පත්‍රය නිකුත් කිරීමට,

(ආ) චෝදනා පත්‍රයට පිළිතුරු ලැබී දෙසතියක් ඇතුළත, අවශ්‍ය අවස්ථාවන්හිදී පරීක්ෂණ විනිශ්චය සභා පත් කිරීමට සහ

(ඇ) විනිශ්චය සභාව පත්කළ දින සිට තෙමසක් ඇතුළත විනය පරීක්ෂණ අවසන් කිරීමටද,

වගබලා ගන්නා මෙන් විනය බලධරයන්ගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනු ලැබේ. මෙසේ කටයුතු කිරීම වළක්වන වැදගත් හේතූන් නොවන්නේ නම්, ඉහත දක්වා ඇති සීමාවන් තරයේ පිළිපැදිය යුතු ය.

Siriwardhana

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

රජ/12.